# බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව
# 2018

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
මානවශාස්ත්‍ර පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

**මාධ්‍ය** : සිංහල

**අධ්‍යයන කාල සීමාව** : එක් අවුරුදු - සෑම ඉරිදා දිනයකම පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා

**ඇතුළත් වීමේ සුදුසුකම්** : අ.පො.ස (උ/පෙළ) සමත් වීම **හෝ** ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත් වීම **හෝ** ධර්මාචාර්ය විභාග පරීක්ෂණය සමත් වී තිබීම

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පාඨමාලා ගාස්තුව** : මෙම පාඨමාලාවේ සම්පූර්ණ ගාස්තුව රු. 45000/-කි. (වාරික වශයෙන් ගෙවන්නේ නම්, පළමු වාරිකය රු.20000/- ක් ද දෙවන වාරිකය රු.15000/- තෙවන වාරිකය රු.10000/-ක් ද වශයෙන් ගෙවිය හැකිය.)

**පාඨමාලා ව්‍යුහය** : මෙම පාඨමාලාව පහත සඳහන් පරිදි අනිවාර්ය පාඨමාලා ඒකක පහකින් (05) සමන්විත වේ.

| | **පාඨමාලා ඒකක** |
|---|---|
| 01 | බෞද්ධ මනෝවිද්‍යාවේ සහ උපදේශනයේ සෛද්ධාන්තික පදනම |
| 02 | බෞද්ධ මනෝවිද්‍යාවේ මූලිකාංග |
| 03 | බෞද්ධ මනෝවිද්‍යාත්මක උපදේශනයේ ක්‍රමශිල්ප හා එහි භාවිතය |
| 04 | මනෝරෝග, ප්‍රතිකාර හා මානසික සුවතාව |
| 05 | නිබන්ධය |

**පාඨමාලාවේ අරමුණ**

මූලික බුද්ධ දේශනා පදනම් කොට ගත් බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දීමත්, බෞද්ධ උපදේශනය හා සම්බන්ධ සිද්ධාන්ත සහ ක්‍රම ශිල්ප අධ්‍යයනය කොට ඒවා නූතන සමාජ මානව ගැටලු විසඳා ගැනීම සඳහා අවස්ථාවෝචිතව හා ප්‍රායෝගිකව භාවිත කිරීම සහ ස්වකීය ජීවිතාභිවෘද්ධියට අදාළ කරගැනීම පිළිබඳ ඵලදායී පුහුණුවක් ලබා දීමත් මෙම පාඨමාලාවෙහි ප්‍රමුඛ අරමුණු වේ.

**විභාග පටිපාටිය**

ප්‍රධාන විෂය ඒකක හතරක් සඳහා අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ. ලිඛිත පරීක්ෂණයට ලකුණු 60 ක් ද, ප්‍රායෝගික පුහුණු, වැඩමුලු හා ක්ෂේත්‍ර අධ්‍යයන සඳහා

ලකුණු 20 ක් ද, පැවරුම් සඳහා ලකුණු 20 ක් ද බැගින් සෑම විෂය ඒකකයක් සඳහා ම ලකුණු 100 බැගින් හිමි වේ. ඊට අමතර ව DBPC 0305x යන පාඨමාලා ඒකකය යටතේ වචන 5000 (පන්දහස) කට නො අඩු නිබන්ධයක් රචනා කළ යුතු වේ. ඊට අදාළ ලකුණු ප්‍රමාණය ද සියයකි.

**ප්‍රායෝගික අභ්‍යාස :-**

මෙම පාඨමාලාවේ අරමුණ බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ න්‍යායාත්මක දැනුම විද්‍යාර්ථීයාට ලබා දීම මෙන් ම ඔහුට වෘත්තීය මට්ටමේ බෞද්ධ උපදේශකයකු වශයෙන් ක්‍රියා කිරීමට අදාළ පුහුණුව හා පළපුරුද්ද ලබා දීමයි. එබැවින් වසරක් පමණ වූ පාඨමාලා කාලය තුළ කේවල හා කණ්ඩායම් වශයෙන් සිදු කරනු ලබන ප්‍රායෝගික උපදේශන වැඩමුළු සඳහා සහභාගීත්වය සහ පූර්ණ මැදිහත්වීම අනිවාර්ය වේ.

**සහතික පත්‍රය :-**

අදාල නිර්ණායක අනුව පරීක්ෂණවලින් සමත්වන හා පාඨමාලාවට අදාළ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන විද්‍යාර්ථීන්ට කැලණිය විශ්වවිද්‍යාලය මගින් බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍රය ප්‍රදානය කෙරේ.

**අයදුම්පත් හා අයදුම් කරන ආකාරය :**

මෙම පාඨමාලාවට ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය kln.ac.lk/?s=application සහ http://hu.kln.ac.lk යන වෙබ් අඩවිවලින් ලබා ගත හැකිය. වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම්පත් තැපැල් මගින් යොමු කිරීමේදී **"බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2018 අයදුම්පත්‍ර ගාස්තුව"** යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ අංක **055-1001-8-0669229** දරන ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.750/-ක් ගෙවා ලබාගත් රිසිට්පත, සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අමුණා එවිය යුතු වේ.

මුදල් ගෙවූ අදාළ බැංකු රිසිට්පත සමග ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ලියන ලද රු.10/-ක් වටිනා මුද්දර ඇල වූ "9x4" ප්‍රමාණයේ ලියුම් කවරයක්, **සම්බන්ධීකාරක, බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට එවීමෙන් තැපැල් මගින් ද අයදුම්පත් ලබාගත හැකිය. (තැපැල් මගින් අයදුම්පත් ඉල්ලුම් කිරීමේ දී ඉල්ලුම් කරන කවරයේ වම් කෙළවරේ **"බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2018 අයදුම්පත් ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතුය)

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.07.18 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ වම් කෙළවරේ **"බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2018"** යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සළකන්න.

පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණයකින් අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ. **(අයදුම්පත් යොමු කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ)**

**විමසීම්**

0112903731 / 0718134557- සම්බන්ධීකාරක